# HDCI 2017 – Assignment(s) of Third Semester

**අපරාධ විමර්ශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2017 හි තෙවන සෙමෙස්තරයේ නිබන්දන**

උපදෙස්

- ❖ 2018.09.08 දින සිට 2018.11.18 දක්වා සති 10 ට ආසන්න කාලයක් ක්ෂේත්‍ර පුහුණුව සඳහා ශික්ෂණ පොලිස් ස්ථාන වලට අනුයුක්ත කරනු ලබයි.
- ❖ එම කාලය තුලදී **අපරාධ විමර්ශන අංශය, ළමා හා කාන්තා අපරාධ විමර්ශන අංශය, විවිධ පැමිණිලි විමර්ශන අංශය** යන අංශ වලට අනුයුක්තව පුහුණුව ලැබිය යුතුය. (පර්යේෂණයට අදාල අංශය)
- ❖ විශේෂයෙන් **අපරාධ විමර්ශන අංශය, විවිධ පැමිණිලි විමර්ශන අංශය** යන අංශ වල සති හතර බැගින්වත් අනුයුක්තව පුහුණුව ලැබීම නිර්දේශ කරනු ලබයි.
- ❖ පුහුණුව ලබන කාලය තුලදී පහත සඳහන් නිබන්දන සහ ඉදිරිපත් කිරීම් සම්පූර්ණ කල යුතුය.
- ❖ විභාග අක්‍රමිකතා සිදුකර තිබීම ප්‍රතිඵල අත්හිටුවීමට හේතු වන අතරම විනයානුකූලව කටයුතු කිරීමටද හේතු වේ.
- ❖ **2018.11.16 දින පැය 1600** ට ප්‍රථම පහත ආකාරයට සම්පූර්ණ කරන ලද නිබන්දන / පැවරුම් විද්‍යුත් තැපැල් මගින් යොමු කළ හැකිය. එසේ නැතහොත් මුද්‍රිත පිටපත් රාගම වෛද්‍ය පීටයේ විභාග අංශයට බාරදිය හැකිය. විද්‍යුත් තැපැල් මගින් යොමු කිරීම හෝ මුද්‍රිත පිටපත් බාරදීම නිසි ලෙස බාරදුන් ලෙස සලකනු ලබයි. කෙසේ වුවද විද්‍යුත් තැපැල් මගින් යොමු කරන ලද නිබන්දන වල **මුද්‍රිත පිටපත්** ඉදිරිපත් කිරීම ඇගයීම් (viva presentation assessment) ආරම්භ කරන දින පැය 0900 ට ප්‍රථමව රාගම වෛද්‍ය පීටයේ විභාග අංශයට බාරදිය යුතුය.
- ❖ ස්වයං ප්‍රකාශ (Declaration form) නිසි ආකෘතිය අනුව සම්පූර්ණ කර නිබන්ධනවල / පැවරුම්වල ගොනුකර තිබිය යුතුය.
- ❖ නිබන්ධන / පැවරුම් සියල්ලක්ම FMAbhaya, AHNelum, Iskoola Pota යන අකුරු වර්ග බාවිතයෙන් පමණක් සකස් කල යුතුය. Font Size – 12, Line Space – 1.5 විය යුතුය. ප්‍රධාන මාතෘකා Font Size – 16 සහ අනු මාතෘකා Font Size – 14 බාවිතා කල යුතුය.

All assignments should be hands over either as a **hard copy to the Exam unit, Faculty of Medicine, University of Kelaniya** or as an **e-copy mail** to **hdciexam@kln.ac.lk** address on or before **16th November 2018, 4.00 pm**. (e-copy should be in pdf format)

The filled **declaration form should be attached to both copies**. Please use scanned copy of filled form to attach to e-copy. Delayed submissions will be subjected to mark reduction as in students' hand book.

Both copies (hard copy and e-copy) should be submitted before the viva presentations.

Please note that plagiarism in any form is an examination offence.



NC

**<u>පාඨමාලාවේ තෙවන සෙමෙස්තරයට අදාලව පහත පරිදි නිබන්ධන සහ ඉදිරිපත් කිරීම් පවතී.</u>**

## 01. <u>Investigative Crime Research & Work-based Assignment - HDCI 21105</u>

<u>RESEARCH ASSIGNMENT - නිබන්ධය</u>

- Assessment will take the form of a work based assignment of between 5000 and 6000 words (includes the outline proposal submitted by the candidate and accepted as appropriate by the teacher or supervisor).
- The outline proposal is to be submitted during the duration of the first semester of programme delivery with the submission of the **completed work based assignment three months time conclusion of the semester**.
- පොලිස් රාජකාරි සම්බන්ධයෙන් ඔබ ඉගෙනගත් දැනුම ආශ්‍රයෙන් පර්යේෂණයක් සිදු කළ යුතු අතර එම සිදුකරන පර්යේෂණය, පර්යේෂණ වාර්තාවක් ලෙස ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා ප්‍රථමයෙන් ඔබ විසින් පර්යේෂණ යෝජනාවලියක් සකස් කර ඔබගේ මොඩියුලභාර ආචාර්යවරයාගෙන් හෝ පත්කර ඇති පර්යේෂණ අධීක්ෂක වරයාගෙන් පර්යේෂණ යෝජනාවලිය සම්මත කර ගත යුතුය.
- ඉන් පසු ඔබ විසින් පර්යේෂණය සිදුකළ යුතු අතර නිරතුරුවම ඔබගේ පර්යේෂණ අධීක්ෂක වරයාගේ උපදෙස් ලබාගත යුතුය / හමු වී සාකච්ඡා පැවැත්විය යුතුය. පර්යේෂණ අවසන් වාර්තාව නියමිත අධ්‍යයන සෙමෙස්තරය අවසන් වී මාස 3කට පසුව භාරදිය යුතුය. පර්යේෂණ අවසන් වාර්තාව භාරදීමට ප්‍රථමව ඉදිරිපත් කිරීම කලයුතුය.
- නිබන්ධය වචන 5000 – 6000 අතර ප්‍රමාණයක් විය යුතුය.

<u>PRESENTATION - ඉදිරිපත් කිරීම</u>

- 30 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 30 ක ඉදිරිපත් කිරීමක්

## 02. <u>Interviewing & Interrogation - HDCI 21113</u>

<u>ASSIGNMENT - නිබන්ධය</u>

- A reflection report of 1500 words on a case which failed at the courts due to poor witness evidence where the number of witness are minimum of 3 from the relevant Station / ASP district / Division certified by the in-service supervisor
- An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes

- අධිකරණ කටයුතුවලදී අසාර්ථක වූ අපරාධ විමර්ශනයක් / විමර්ශන මේ සම්බන්ධයෙන් තෝරාගත යුතුය. මෙම අසාර්ථකවීම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වාර්තා කර තිබීමේ දුර්වලතාවය හේතුවෙන්, අධිකරණයේදී අසාර්ථක වූ අපරාධ විමර්ශනයක් / විමර්ශන විය යුතුය. අදාළ අපරාධ විමර්ශන යෙහි පැමිණිලිකරු ඇතුළුව සාක්ෂිකරුවන් තිදෙනෙකුවත් සිටිය යුතු අතර එලෙස සාක්ෂි කරුවන් තිදෙනෙකු සිටින එක් අපරාධ විමර්ශනයක් සොයාගත නොහැකිනම් අපරාධ විමර්ශන දෙකක් සම්බන්ධයෙන් වෙන වෙනම අධ්‍යයනය කළ හැකිය.
- ඔබ විසින් ලබාගත් විෂය දැනුම උපයෝගී කරගෙන අදාල සාක්ෂි වාර්තා කිරීමේ දුර්වලතාවයන් මොනවාද යන්න සහ මෙම දුර්වලතාවන් මඟහරවා ගනිමින් ඔබ විසින් සාක්ෂි වාර්තා කිරීම සිදු කරනු ලබයි නම් එලෙස සිදු කරන ආකාරය මනාව පැහැදිලි කර තිබිය යුතුය.
- වාර්තාව වචන 1500 ට නොඅඩු විය යුතුය.

- අදාළ අපරාධ විමර්ශනයට අදාලව වාර්තා කර ඇති ප්‍රකාශ වල සහතික කළ උද්ධෘත පැවරුමෙහි ඇමුණුමක් ලෙස ගොනු කර තිබිය යුතු අතර, අසාර්ථකවීමට බලපාන ලද ප්‍රධාන කරුණු සලකුණුකර තිබිය යුතුය.
- පැවරුමට අධික්ෂණ නිලධාරීන්ගෙන් නිසි නිර්දේශයන් ද ලබා ගෙන තිබිය යුතුය.

PRESENTATION - ඉදිරිපත් කිරීම

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

## 03. Witness & Suspect Interviewing Skills - HDCI 21124

ASSIGNMENT - නිබන්ධය

- Three interview and interrogation plans and statements (complainer / witness / suspect) certified by the in-service supervisor. Candidates are expected to achieve a competence standard in all areas.
- ඔබ ක්ෂේත්‍ර පුහුණු කටයුතු සඳහා අදාල ස්ථානයේ වාර්තා කිරීමෙන් අනතුරුව අපරාධ විමර්ශන අංශයෙහි, ළමා හා කාන්තා අපරාධ විමර්ශන අංශයේ, විවිධ පැමිණිලි අංශයේ වාර්තාවන පැමිණිල්ලක් / පැමිණිලි කිහිපයක් සම්බන්ධයෙන් ඔබ ලබාගත් දැනුම ආශ්‍රයෙන් පැවරුම සිදුකළ යුතුය. මෙම පැවරුමේ දී පැමිණිලිකරුවකු / සාක්ෂිකරුවකු / සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට අදාලව සැලැස්ම (interview plan) සකස් කළ යුතු අතර එම සැලැස්මට අනුව සම්මුඛ සාකච්ඡා සිදුකර ප්‍රකාශ වාර්තා කළ යුතුය. එමෙන්ම අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් සැකකරු / සැකකරුවන් ප්‍රශ්න කිරීමට අදාළ සැලැස්ම (interrogation plan) සකස් කළ යුතු අතර එම සැලැස්මට අදාලව සැකකරු / සැකකරුවන් ප්‍රශ්නකර ප්‍රකාශ වාර්තා කළ යුතුය.
- පැවරුම ලෙස ඔබ විසින් සකස්කරන ලද සැලැස්මවල් ද එයට අදාලව වාර්තා කළ සහතික කරන ලද ප්‍රකාශ උද්ධෘත පිටපත් ද ඉදිරිපත් කළ යුතුය. අවම වශයෙන් පුද්ගලයන් පස් දෙනෙකුට අදාළව ඉහත ක්‍රියාමාර්ග ගෙන තිබීම අත්‍යාවශ්‍යය. එම පුද්ගලයන් පස් දෙනා අතර අනිවාර්යයෙන්ම පැමිණිලිකරුවකු, සාක්ෂිකරුවකු, සැකකරුවෙකු, ළමයකු සහ කාන්තා වින්දිතයකු සිටිය යුතු අතර පැමිණිලි (සිද්ධි) 3කට වඩා යොදා නොගත යුතුය. අදාළ පැමිණිල්ල වාර්තා වීම සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශයන් පැවරුමට ඇතුළත් කළ යුතුය.
- මෙලෙස සැලසුම් සකස්කරමින් සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්ණ කිරීමේ සාර්ථක / අසාර්ථකභාවය, වාසි / අවාසි, වැදගත්කම සම්බන්ධයෙන් පිටු 2කට නොවැඩි වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතුය.

PRESENTATION - ඉදිරිපත් කිරීම

- 15 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 15 ක ඉදිරිපත් කිරීමක්

## 04. Cyber Crime Investigation - HDCI 21133

ASSIGNMENT - නිබන්ධය

- Presentation three case scenarios reported by the newspapers based on real investigation. An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes
- මෙම වර්ෂය තුළ දී වාර්තාවී ඇති සයිබර් අපරාධ සිද්ධි සම්බන්ධයෙන් පුවත්පත්වල පළවී ඇති ප්‍රවෘත්ති දෙකක් පදනම් කරගනිමින් ඔබගේ අධ්‍යයනය සිදු කළ යුතුය. මේ සඳහා Hacking, Phishing, ෆේස්බුක්

සම්බන්ධ අපරාධ, Sextortion සම්බන්ධ අපරාධ, pornography සම්බන්ධ අපරාධ ආදී ඕනෑම ආකාරයක සයිබර් අපරාධ දෙකක් යොදාගත හැකිය. අදාළ ප්‍රවෘත්ති දෙක තෝරාගැනීමේදී එකිනෙකට වෙනස් අපරාධ සම්බන්ධයෙන් අවධානය යොමුකර තිබිය යුතුය.

- එක් එක් අපරාධය සඳහා විමර්ශන සැලැස්ම (plan of investigation) ද සකස් කළ යුතුය. එම අපරාධ දෙක සම්බන්ධයෙන් වෙන වෙනම **සමස්ත විමර්ශන ක්‍රියාවලිය ආරම්භයේ සිට අධිකරණ කටයුතු දක්වා** පියවරෙන් පියවර සියලුම පරාසයන් ආවරණය වන පරිදි වාර්තා කළ යුතුය. එම විමර්ශන සිදුකිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලයද වාර්තා කළ යුතුය.
- ඔබ තෝරාගත් පුවත්පත්වල පළවී තිබූ ප්‍රවෘත්ති දෙක, පැවරුමෙහි ඇමුණුම් ලෙස දිනය, පුවත්පතේ නම සටහන් කර ගොනු කර තිබිය යුතුය. ප්‍රවෘත්ති දෙක තෝරා ගැනීම ප්‍රවෘත්ති නිල වෙබ් අඩවියකින් වුවද කල හැකි නමුත් ගොසිප් වෙබ් අඩවි වලින් තෝරා නොගත යුතුය. ප්‍රවෘත්ති දෙක එලෙස වෙබ් අඩවියකින් තෝරා ගතහොත් වෙබ් ලිපිනය, ප්‍රවෘත්ති පළවී තිබූ දින සහ එම පුවත්වල මුද්‍රිත පිටපත් ගොනු කර තිබිය යුතුය.

PRESENTATION - ඉදිරිපත් කිරීම

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

**Date – 07th September 2018**

-----------------------------------------------------------------------------------------------------------------------------------